සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 96-115
ISSN 1800-1459

# පරිසර පිරිහීම් සහ ගෝලීය පරිභෝජනයේ යථාර්ථය: පරිසර සමාජ විද්‍යාත්මක විමර්ශනයක්

**සුසන්ත රත්නායක සහ ප්‍රදීප් උළුවඩුගේ**

සමාජ විද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## සාරසංක්ෂේපය

නූතන සමාජය අන් කවරදාවකත් අත් නොවිඳි තීරණාත්මක අභියෝග රැසකට මුහුණ දී ඇති බව පෙනේ. ගෝලීය ආර්ථික බිඳ වැටීම්, යුද ගැටුම්, බලශක්ති අර්බුද, ආහාර අර්බුද සහ පාරිසරික බිඳ වැටීම් ඒවා අතර ප්‍රධාන වේ. මේ සියල්ල ම මානව සමාජයේ ඉදිරි පැවැත්ම හා තීරණාත්මක ව බැඳී පවතින සාධකයෝ වෙති. මෙවැනි අභියෝග ජය ගැනීම සඳහා සාර්ව සහ ක්ෂුද්‍ර පරිමාණ මැදිහත්වීම් ද දැකිය හැකි ය. විවිධ සංවර්ධන ආයතන, පාරිසරික ආයතන තාක්ෂණික හා විද්‍යාත්මක අත්හදා බැලීම් සහ භාවිතයන් විවිධ අංශ මගින් සිදු කළ ද ගැටලුවල තීව්‍රතාවේ වැඩිවීම මිස අඩුවීමක් හඳුනාගත නො හැකි ය. මේ අතර පාරිසරික වශයෙන් ඇති වී තිබෙන ගැටලු නූතනයේ වඩාත් කතාබහට ලක් වූ මාතෘකාවකි. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම (හරිතාගාර ආවරණ), ස්වාභාවික සම්පත් විනාශ වී යාම, ගං වතුර, ජෛව විවිධත්වය බිඳ වැටීම, ඕසෝන් ස්ථරය පළුදු වීම, වනාන්තර විනාශය, අපද්‍රව්‍ය බැහැර කිරීම, පාංශු දූෂණය, ජාන විනාශය හා ජාන මංකොල්ලය නූතන මානව සංහතියේ පැවැත්ම තීරණය කරනු ලබන ප්‍රධාන පාරිසරික ගැටලු වේ. බොහෝ විට මෙම පාරිසර ගැටලු විශ්ලේෂණය කිරීමේ දී දැකිය හැක්කේ තාක්ෂණික හා කාර්මික සංවර්ධනයේ දුර්විපාක වශයෙන් හෝ ජනගහන වර්ධනයේ දුර්විපාකයන් වශයෙන් පමණක් හෝ විග්‍රහ කිරීමට ගනු ලබන උත්සාහයන් ය. නමුත් එම විශ්ලේෂණයන් ප්‍රමාණවත් නොවන්නේ නූතන පාරිසරික ගැටලු ඍජුව ම මානව පරිභෝජනය වැනි සමාජ විද්‍යාත්මක හේතු හා සම්බන්ධ ව පැවතීම ය. ගෝලීය වශයෙන් ව්‍යාප්ත ව ඇති පරිභෝජනවාදය නූතන පාරිසරික පිරිහීම්වලට බලපාන ප්‍රධාන සාධකයකි. සංවර්ධිත රටවල් විසින් මෙහෙය වන නූතන පරිභෝජන ක්‍රමය පරිභෝජනයේ සංස්කෘතික සීමාවන් සහ පරිභෝජන ගතිකත්වයන් අතික්‍රමණය කොට ඇත. සංවර්ධනය වෙමින් පවතින රටවල පරිසර හිතකාමී පරිභෝජන රටාවන් අභියෝගයට ලක්කොට ඇත. ඒ අනුව මෙම ලිපියෙන් උත්සාහ ගෙන ඇත්තේ නූතන ගෝලීය පාරිසරික අර්බුද කෙරෙහි බලපාන සමාජය, සංස්කෘතික ප්‍රපංචයක් වන මානව පරිභෝජනය පිළිබඳ ව සමාජ විද්‍යාත්මක විග්‍රහයක් කිරීමට ය.

**කේන්ද්‍රීය වචන:** ගෝලීය පරිභෝජනය, පරිසර පිරිහීම්, පරිභෝජන අසමානතාව, භෞතිකවාදී පරිභෝජනය

## හැඳින්වීම

මෙම ලිපියෙන් උත්සාහගෙන ඇත්තේ පාරිසරික ගැටලු පිළිබඳ ව සමාජවිද්‍යාත්මක පර්යාවලෝකය ඇසුරින් විග්‍රහයක් සැපයීමට ය. එහි දී කේන්ද්‍රීය විශ්ලේෂණ සාධකය වශයෙන් මානව පරිභෝජනය සහ පරිසර ගැටලු අතර සම්බන්ධතාව සාකච්ඡාවට ගෙන ඇත. 19 වන සියවස සහ ඉන් මෙපිට සිදු වූ කාර්මික හා තාක්ෂණික වෘද්ධියේ ප්‍රතිවිපාක වශයෙන් පාරිසරික ගැටලු හඳුනා

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 96-115
ISSN 1800-1459

ගැනීමට බොහෝ දෙනා උත්සාහ ගනිති. එම නිසා ම පසුගිය දශක කිහිපය තුළ අන්තර්ජාතික මට්ටමෙන් සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීමේ දී පාරිසරික තිරසරභාවය පිළිබඳ සැළකිල්ල වැඩි විය. ඒ සඳහා ජාත්‍යන්තර සංවිධාන ද රාජ්‍ය හා රාජ්‍ය නොවන මට්ටමින් බිහි වී ඇත. පරිසරය සහ සංවර්ධනය යන තේමාව යටතේ එක්සත් ජාතීන්ගේ සංවිධානය රියෝවල පවත්වා ආරම්භකරන ලද පුළුල් දේශපාලන සංවාදය නූතනය වන විට ප්‍රබල මාතෘකාවක් බවට පත්ව ඇත. එහි දී පාරිසරික ගැටලු ඇතිවීම සඳහා බලපාන ප්‍රධාන සාධක කිහිපයක් සාකච්ඡාවට භාජනය වී ඇත. පුළුල් වශයෙන් සාකච්ඡාවට භාජනය වී ඇත්තේ බටහිර සංවර්ධනය වූ රටවල නිෂ්පාදන ක්‍රමය, පරිභෝජනය හා සංවර්ධනය වෙමින් පවතින රටවල කාර්මික වර්ධනය හා ජනගහන වර්ධනය යි. නමුත් මෙම ලිපියෙන් විග්‍රහ කොට ඇත්තේ මානව පරිභෝජනය පිළිබඳව පමණි.

සමාජවිද්‍යාත්මක ව පාරිසරික ගැටලු විශ්ලේෂණය කරනු ලබන ප්‍රධාන න්‍යාය ප්‍රවේශයන් දෙකක් දැකිය හැකි ය. එනම් මානව සුවිශේෂතාව පිළිබඳ සුසමාදර්ශය (*Human Exemptionalism Paradigm* (HEP) සහ නව පරිසරවිද්‍යාත්මක සුසමාදර්ශය (New Ecological Paradigm (NEP) වශයෙනි. පළමු ප්‍රවේශය මගින් උත්සාහ ගෙන ඇත්තේ මානව-පරිසර අන්තර් සම්බන්ධතාවේ දී මිනිසාගේ අද්විතීයත්වය විග්‍රහ කිරීමට ය. එහි දී මිනිසාට සිය වෘද්ධිය සඳහා පරිසරය රිසි අයුරින් වෙනස් කළ හැකි ය. මිනිසා පාරිසරික බැම්වලින් නිදහස් ය. ඒවා අභිබවා යාමේ හැකියාව මිනිසා සතුව පවතී. ඇතිවන පාරිසරික ගැටලුවලට විසඳුම් සෙවීමේ හැකියාව ඇත්තේ ද මිනිසාට ය යනු මානව සුවිශේෂතාව පිළිබඳ සුසමාදර්ශයේ ප්‍රධාන තර්කය. සමාජ නවීකරණය පිළිබඳ න්‍යායවේදීන් සහ ඇමරිකානු චිකාගෝ ගුරුකුලයේ නාගරික සමාජවිද්‍යාඥයෝ මෙම සුසමාදර්ශය පෝෂණය කළහ.

1970 ගණන්වල දී ලෝක මට්ටමින් පරිසරය සහ සංවර්ධනය පිළිබඳ ආරම්භ වූ සංවාදයත් විශේෂයෙන් ම නවීකරණ න්‍යායේ ප්‍රායෝගිකත්වය බිඳ වැටීමත් සමග පෙර කී න්‍යායාත්මක කථිකාව විවේචනයට ලක්වි ය. මානව කේන්ද්‍රියව (Ethno-centrism) පරිසර අන්තර් ක්‍රියාකාරීත්වය විග්‍රහ කිරීම පළමු න්‍යායාත්මක පර්යාවලෝකයේ ඇති ප්‍රධාන දුර්වලතාව යි. දෙවනුව ගොඩනැගෙන නව පරිසරවිද්‍යාත්මක සුසමාදර්ශය මගින් පරිසර කේන්ද්‍රීයව (Eco-centrism) මානව-පරිසර අන්තර් සම්බන්ධතාව විග්‍රහ කිරීමට උත්සාහ ගෙන ඇත. එහි දී මතු කරන ප්‍රධාන තර්කය වන්නේ මිනිසා ද පරිසර පද්ධතියේ එක් පුරුකක් පමණි යන්නය. නැතහොත් පරිසර නියතීන්ගෙන් මිනිසා නිදහස් නොවේ. කැටන් (Catton) සහ ඩන්ලැප් (Dunlap) පරිසර සමාජවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් පරිසරය තුළ ඇතිවන තරඟකාරී ක්‍රියාවන් තුනක් උපයෝගී කර ගනිමින් ගොඩනගනු ලබන ආකෘතියක් ඇසුරින් පරිසරයේ කෘත්‍යය පැහැදිලි කිරීමට උත්සාහ ගෙන ඇත[1]. එම ආකෘතියට අනුව පරිසරය මිනිසාට ප්‍රධාන කෘත්‍යයන් තුනක් ඉටු කරයි. එනම්,

1. පරිසරය සැපයුම් අවකාශයක් වශයෙන්
2. ජීවන අවකාශයක් වශයෙන්
3. අපද්‍රව්‍ය බැහැර කරන අවකාශයක් වශයෙන් (Hannigan, 1995:17-18).

[1] කැටන් සහ ඩන්ලැප්ගේ මෙම පරිසරවිද්‍යාත්මක විග්‍රහය පරිසරය පිළිබඳ සමාජවිද්‍යාවේ කළල අවස්ථාව වශයෙන් හඳුනා ගැනේ

*සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 96-115*
*ISSN 1800-1459*

පරිසරය සැපයුම් අවකාශයක් වශයෙන් ගත්විට මානව පැවැත්ම සඳහා අලුත්වැඩියා කළ හැකි හා කළ නොහැකි සම්පත් ලබා දේ. නමුත් සම්පත් අධිපරිභෝජනය කළහොත් එය පරිසර පිරිහීමට හේතු වේ. ජීවන අවකාශයක් වශයෙන් ද පරිසරය ක්‍රියා කරයි. ඉදිකිරීම්, වගාවන් සහ විවිධ සංවර්ධන කාර්යයන් සඳහා පරිසරය භාවිත කෙරෙයි. මෙය ද අධිපරිභෝජනයට ගතහොත් ජනගහන තදබදය සහ අනෙක් ජීව වර්ගයාගේ පැවැත්මට තර්ජන එල්ල වේ. මානව නිෂ්පාදනයේ අතුරුඵල වන අපද්‍රව්‍ය සහ කාර්මික බැහැර කිරීම් රඳවා ගන්නේ ද පරිසරයයි. එහි ද සීමාව ඉක්මවා ගිය හොත් ඇතිවන්නේ පාරිසරික විනාශය යි.

> ගෝලීය ධනවාදයේ ප්‍රධාන රැඟුම්කරු වන්නේ ධනවාදී පරිභෝජන ආකෘතිය යි. මෙම බටහිර පරිභෝජන ආකෘතිය භූ ගෝලීය වශයෙන් සිමාමායිම් තරණය කර ඇති අතර ඇත. ඇතැම් සමාජවිද්‍යාඥයින් දක්වන්නේ බටහිර සංවර්ධන ආකෘතිය ඔස්සේ ගෝලීයගත වන ධනවාදී පරිභෝජන ශෛලිය දේශීය ජීවන ක්‍රමයන්, පාරිසර සංවේදීතාවයන්, පරිසර හිතකාමී දැනුම සහ සංසකෘතීන් අභියෝගයට ලක්කොට ඇති බවයි (සිරිසේන, 2010:144).

ඒ අනුව මෙම ලිපිය මගින් ගෝලීය පරිභෝජනය සහ පරිසර ගැටලු යන විචල්‍යයන් දෙක පිළිබඳව සමාජවිද්‍යාත්මක කථිකාවක් සිදු කිරීමට උත්සාහ ගෙන ඇත. එහි දී න්‍යායාත්මක රාමුව වශයෙන් නව පරිසරවිද්‍යාත්මක සුසමාදර්ශය යොදාගෙන ඇත.

## සාහිත්‍ය විමර්ශනය

ජනගහනය සහ පරිසර පිරිහීම් අතර ඍජු සම්බන්ධතාවක් පවති. ජනගහන වර්ධනය පරිසර තත්ත්වයන් මත එල්ල කරනු ලබන පීඩනය විග්‍රහ කිරීම ජනගහනය සහ පරිසරය අතර සම්බන්ධතාව විග්‍රහ කිරීමේ දී දැකිය හැකි කේන්ද්‍රීය ප්‍රවණතාවකි. විශේෂයෙන් ම නූතන පරිසර බිඳ වැටීම් පිළිබඳ සාකච්ඡා කරන විට බොහෝ විට දැකිය හැක්කේ සංවර්ධනය වෙමින් පවතින රටවල වර්ධනය වන ජනගහනයට චෝදනා එල්ල වීම ය. ඊට අවශ්‍ය පදනම සැකසෙන්නේ මැල්තීසියානු ජනගහන විශ්ලේෂණය ගොඩනැගීමත් සමග ය. ඉංග්‍රීසි ජාතික පූජකවරයෙකු වූ තෝමස් මැල්තස් 1798 දී ඉදිරිපත් කළ ජනගහන ප්‍රතිපත්ති පිළිබඳ විවරණයක් (Essay on the Principle of Population) යන රචනාවෙන් පැහැදිලි කරන්නේ ලෝක ජනගහනය ගුණෝත්තර ශ්‍රේණියකින් (2, 4, 8, 16 ආදී) වැඩි වන විට ආහාර නිෂ්පාදනය වැඩි වන්නේ සමාන්තර ශ්‍රේණියකින් (1, 2, 3, 4 ආදී) වන බවයි. මේ නිසා වැඩි වන ජනගහනය හේතුවෙන් ස්වාභාවික සම්පත් පිරිහීයාමක් ඇති වන බවත් එය ජනගහන දෙදරා යාමකට හේතු වන බවත් පැහැදිලි කරයි. ඉක්මනින් පාලනය නොකළ හොත් ගෝලීය ජනගහන වර්ධනය නිසා පොළොවේ සම්පත් අන්තෙට ම පිරිහීයාමත් එයට උසුලා සිටිය හැකි උපරිම ධාරිතාවය[2] (Carriying capacity) ඉක්මවා යනු ඇතැයි යන්න නිගමනය විය (Malthus, 1976:21-26).

[2] ජීව විද්‍යාත්මක ව ඉසුළුම් ධාරිතාව යනු සීමිත වාසස්ථානයකට අනියත කාල සීමාවක දී පෝෂණය කළ හැකි ජීව සංඛ්‍යාවක උපරිම ප්‍රමාණය යි. මැල්තීසියානු විග්‍රහයේ දී මින් අදහස් කරන්නේ පෘථිවි තලයට පවත්වාගෙන යාහැකි උපරිම ජනගහනය වශයෙනි

මැල්තස්ගේ න්‍යාය පදනම් කර ගනිමින් සංවර්ධන ප්‍රතිපත්ති පිළිබඳ සාකච්ඡා කළ සංවර්ධනවේදීන් දක්වන්නේ වනාන්තර විනාශය, කාන්තාරකරණය, පාංශු ඛාදනය, ඕසෝන් තට්ටුව තුනීවීම, ජෛව විවිධත්වය බිඳ වැටීම, අම්ල වැසි සහ ගෝලීය උණුසුම ඉහළ යාම ආදී සියලූ ම පාරිසරික ගැටලුවලට වගකිව යුත්තේ වැඩිවන ජනගහනය යි (Ehrlich & Anne 1990:39). 1972 දී පළකළ රෝම සංගමයේ (Club of Rome) 'වර්ධනයට සීමාවන්''(Limites to growth) නම් වාර්තාවට අනුව සීඝ්‍ර ජනගහන වර්ධනය අළුත් කළ නොහැකි ස්වාභාවික සම්පත් ක්ෂය කරමින් ගෝලීය ඉසුළුම් ධාරිතාව පසුකර යන බව පැහැදිලි කරයි. තව ද මියඩෝව්ස් ඇතුළු පිරිස (1972) දක්වන ආකාරයට තාක්‍ෂණයේ වර්ධනයට කිසිසේත් පිරිහෙන ජීවිතවල ගුණාත්මක බව හෝ සම්පත් හිඟය නිසා ඇති වන ලාභය හීණ වීම සහ පරිසර දූෂණයන් ජයගත නො හැකි ය. මේ නිසා වසර 100ක් තුළ දී ජනගහනයේ බිඳ වැටීමක් ඇති වන බවට තර්ක කරයි (Meadows et al, 1972:91-92).

අනෙක් අතට මැල්තීසියානු සංවර්ධන වේදීන්ගේ උප කල්පනයන්ට ප්‍රතිවිරුද්ධ අදහස් දක්වන ඊස්ටර් බස්රප් (1965) වැනි ආර්ථික විද්‍යාඥයින් දක්වන්නේ ජනගහන වර්ධනය නිසා අනාගතයේ ඇතිවිය හැකි පීඩාවන්ට පිළියම් සැපයීමේ හැකියාව ද මිනිසාට පවතින බවයි. තාක්‍ෂණයේ සහ විද්‍යාත්මක දියුණුවේ වෘද්ධිය මගින් මෙම ගැටලුවලට විසඳුම් සෙවිය හැකිය යන්න මොවුන්ගේ ප්‍රධාන තර්කය යි (Bosrup, 1965:80-91). කෙසේ වුව ද පොදුවේ ගත් විට මැල්තීසියානු සංවර්ධන වේදීන්ගේ චෝදනාවට ඍජුවම ලක් වන්නේ සංවර්ධනය වෙමින් පවතින රටවල වැඩිවන ජනගහනය යි. පිරිහෙමින් පවත්නා ගෝලීය පාරිසරික තත්ත්වයන්ට වගකිව යුතු යැයි ඔවුන් ඍජුව ම චෝදනා කරන්නේ සංවර්ධනය වෙමින් පවත්නා රටවලට ය. මේ සඳහා ඇති එක ම විසඳුම ලෙස ඔවුන් දකින්නේ උප්පත්ති පාලනය යි. ඔවුන් නිගමනය කොට ඇති එක් කරුණක් වන්නේ සංවර්ධනය වෙමින් පවතින රටවල දුප්පත් ජනගහනය පාරිසරික වශයෙන් විනාශකාරී චර්යාවන්ට පෙළඹීම පරිසර බිඳවැටීමට හේතු වනවා ය යන්නයි. ඔවුන් තුන්වන ලෝකයේ ගොවියන් හැඳින් වූයේ පරිසරය ගොදුරට ගන්නා අය ලෙසයි (Nyerges, 1987:82). නමුත් මෙහි ඇති ඛේදජනක තත්ත්වය වන්නේ මැල්තීසියානු සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදකයින් කේන්ද්‍රයේ රටවල විදුලි වේගයෙන් වර්ධනය වන තාක්‍ෂණය, කාර්මික ධනවාදය සහ පරිසර අනර්ථ පරිභෝජන ක්‍රමය වැනි විචල්‍යයන් පරිසර පිරිහීමට බලපානවාය යන්න සාකච්ඡා නොකිරීම යි. සැබවින් ම නූතන පරිසර ගැටලු දෙස විමර්ශනාත්මක ව බලන්නේ නම් ජනගහන වර්ධනය හෝ ජන ඝනත්වය වැනි සාධක ඔස්සේ පමණක් නූතන පරිසර පිරිහීම් තේරුම් කළ නො හැකි ය. කාර්මීකරණය, ධනවාදය සහ ගෝලීය පරිභෝජනය වැනි ප්‍රධාන සංරචක ඒ සඳහා ඍජුවම බලපා යි. ඒ අනුව මෙම පර්යේෂණාත්මක ලිපියෙන් උත්සාහ කොට ඇත්තේ ගෝලීය පරිභෝජනය පාරිසරික බිඳවැටීම්වලට හේතු වන්නේ කෙසේ ද? යන්න විමර්ශනයට ලක් කිරීමට යි.

## පර්යේෂණ ගැටලුව

ගෝලීය පාරිසරික පිරිහීම් පිළිබඳ සාහිත්‍යය පරීක්‍ෂා කිරීමෙන් පැහැදිලි වන්නේ තුන්වන ලෝකයේ රටවල වැඩිවන ජනගහනය ඊට ප්‍රබල ව වගකිව යුතු යැයි

ISSN 1800-1459

මතු කරන තර්කයන් ය. නමුත් සංවර්ධිත රටවල් විසින් පවත්වාගෙන යනු ලබන පරිභෝජන ආධිපත්‍යය ප්‍රශ්න නොකර යි. ඒ අනුව මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ ගෝලීය පරිභෝජනය නූතන පරිසර පිරිහීමට බලපාන්නේ කෙසේ ද? යන්න යි.

## පර්යේෂණ අරමුණු

මෙම ලිපියේ දී ප්‍රධාන අධ්‍යයන අරමුණු තුනක් විමර්ශනයට ලක්කොට ඇත

අ. නූතන පරිභෝජනය ක්‍රමය පරිසර බිඳවැටීම්වලට බලපාන්නේ කෙසේ ද?

ආ. ගෝලීය පරිභෝජනය සමාජ අසමානතාව නිර්මාණය වීම සඳහා බලපාන්නේ කෙසේ ද?

ඇ. ගෝලීය පරිභෝජනය සංවර්ධනය වෙමින් පවතින රටවල පරිභෝජනයට කරනු ලබන බලපෑම කුමක් ද?

## පර්යේෂණයේ වැදගත්කම

යථෝක්ත අරමුණු ඉටු කිරීම මගින් නූතන ගෝලීය පාරිසරික අර්බුදය කෙරෙහි බලපාන සමාජය සංස්කෘතික ප්‍රපංචයක් වන මානව පරිභෝජනය පිළිබඳ ව සමාජ විද්‍යාත්මක විග්‍රහයක් මගින් නව විෂය පිළිබඳ නව දැනුම් සම්පාදනය කිරීමට හැකිවීම මේ පර්යේෂණයේ වැදගත් කමයි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ද්විතියීක මූලාශ්‍රය ඇසුරෙන් කෙරෙන විශ්ලේෂණයකි. රැස්කරගත් ද්විතියීක දත්ත සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම ඔස්සේ සහ විස්තරාත්මක ක්‍රමය ඔස්සේ විශ්ලේෂණය කොට ඇත. එහි දී පදීතයේ ඇතැම් කරුණු තහවුරු කිරීම සඳහා ඍජු හා වක්‍ර උද්ධෘත භාවිතකොට ඇත.

## සාකච්ඡාව

### ගෝලීය පරිභෝජනයේ ස්වභාවය

ආහාර, වාතය, ජලය, නිවාස, ඇඳුම් පැළඳුම් හා ඖෂධ වැනි මූලික හා ජීව විද්‍යාත්මක අවශ්‍යතාවලින් තොර ව කිසිසේත් මානව සමාජය නො පවතී. මානව ඉතිහාසයේ ආරම්භයේ සිට ම සමාජය සහ පරිසරය අතර අන්තර් සම්බන්ධතාව නිර්මාණය වී ඇත්තේ මෙම අවශ්‍යතාවන් සංතෘප්ත කර ගැනීමට ගන්නා ලද උත්සහයේ ප්‍රතිඵලයක් ලෙස ය. නමුත් නූතන පරිභෝජන රටාවන් "මූලික අවශ්‍යතාවන් සපුරාලීම" යන තත්ත්වයෙන් බැහැර වී ඇත. "ඇයි අප පරිභෝජනය කරන්නේ?" (Why do we consume?) යන ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් ජීවත්වීම සඳහා හෝ මූලික අවශ්‍යතා සපුරා ගැනීම් වශයෙන් ලබා දිය හැකි පිළිතුරු අධි සරළ වූ ඒවා ය. ගෝලීය පරිභෝජනය ඉන් එහා දිව යන සමාජ ප්‍රපංචයකි. සමාජ අසමානතාව, බලය හා සමාජ තත්ත්වය යන කරුණු ඒ හා ඍජුව ම සම්බන්ධ ව පවතී.


සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 96-115
ISSN 1800-1459

බෙල් (2004) දක්වන ආකාරයට නූතන පරිභෝජන ක්‍රමය අස්ථිරසාර (Unsustainable) පරිභෝජනයකි. එනම් අසමාන, අසාධාරණ සහ පරිසර හිතකාමී නො වන පරිභෝජන ක්‍රමයකි. එය පරිභෝජනවාදයක් දක්වා වර්ධනය වී ඇත (Bell, 2004:82). ( පරිභෝජනවාදය යන්න පසුවට විස්තර කෙරේ).

> ''නූතන ලෝකයේ ජීවත්වන මිනිස්සු බිලියන 5.8 ක් පමණ සෑම දිනකම නිරාහාරව සිටිති. දකුණු අර්ධ ගෝලයේ ජනගහනයෙන් තුනෙන් එකක් පමණ එනම් බිලියන 1.3 කට ආසන්න සංඛ්‍යාවක් දරුණු දරිද්‍රතා කාණ්ඩයේ ජීවත් වෙති. ඔවුනට ජීවත් වීමේ මූලික අවශ්‍යතා වූ සෞඛ්‍යාරක්ෂාව හා පිරිසිදු වතුර වැනි දෑ නැත. තුන්වන ලෝකයේ සෑම දිනක ම අවුරුදු පහකට අඩු 35,000 ක් දුගී බව හා සම්බන්ධ හේතු නිසා මිය යති. 1990 දී ත්, එකල සෝවියට් ජන රජය හා නැගෙනහිර යුරෝපයේ රටවල් ඇතුළු කාර්මික වූ රටවල ද මිලියන 200 ක් පමණ වූ ජනකාය දුගී ගණයට වැටෙන තත්ත්වයේ ජීවත් වූහ. එක්සත් ජනපදයේ ළමයින්ගෙන් 20% ක් අද පවා ජීවත් වනනේ දුගී රේඛාවට යටින් ය'' (බණ්ඩාරගේ, 2001:2).

මින් පැහැදිලි වන්නේ පරිභෝජනය අතින් ලෝක ගෝලයේ උතුර සහ දකුණ අතර පවතින අසමානතාවයි.

ලෝක බැංකුවේ 2008 සංවර්ධන දර්ශකවලට අනුව ලෝක ගෝලයේ ධනවත් ම පිරිස වන 20% ක ප්‍රමාණයක් ගෝලීය පරිභෝජනයෙන් 76.6%ක් පරිභෝජනය කරති. පරිභෝජන පඩිපෙළෙහි මැද කොටස වන 60%ක ප්‍රමණයක් ගෝලීය පරිභෝජනයෙන් 21%ක් පරිභෝජනය කරන අතර ගෝලීය පරිභෝජනයේ ආන්තික පිරිස වන දුප්පත්ම 20%ක ප්‍රමාණයකට හිමි වන්නේ ගෝලීය පරිභෝජනයෙන් 1.5%ක් පමණි (රූප සටහන් 01 බලන්න). ගෝලීය පරිභෝජන අසමානතාව තව දුරටත් වර්ධනය වෙමින් පවතී. ඒ අනුව ගෝලීය දුප්පත්ම 10%ක පරිභෝජනය කරන්නේ ගෝලීය පරිභෝජනයෙන් 0.5%ක් පමණි. මේ අතර පොහොසත් ම 10%ක පිරිස ගෝලීය පරිභෝජනයෙන් 59%ක් පරිභෝජනය කරති (World Bank Development Indicators, 2008).




**රූප සටහන 01: ගෝලීය පරිභෝජනය බෙදී යාම**

ගෝලීය පරිභෝජනයේ අසමාන ව්‍යාප්තිය කොතරම් බැරෑරුම් ද යන්න තවදුරටත් පහත සඳහන් සංඛ්‍යා දත්ත මගින් පැහැදිලි වේ. ලෝක ගෝලයේ ධනවත් ම

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 96-115
ISSN 1800-1459

5%ක ප්‍රමාණය සහ දුප්පත් ම 5%ක ප්‍රමාණය අතරේ පරිභෝජනය බෙදී ගොස් ඇත්තේ පහත සඳහන් පරිදි ය.

**වගු අංක 01: ලෝක ගෝලයේ ධනවත්ම 5%ක ප්‍රමාණය සහ දුප්පත්ම 5%ක ප්‍රමාණයේ පරිභෝජනය**

| පරිභෝජනයේ ස්වභාවය | පොහොසත්ම 5% හේ පරිභෝජනය | දුප්පත්ම 5% හේ පරිභෝජනය |
|---|---|---|
| සියලු වර්ගවල මස් සහ මාළු | 45% | 5% |
| ශක්ති පරිභෝජනය | 58% | 4%< |
| දුරකථන රැහැන් | 74% | 1.5% |
| කඩදාසි භාවිතය | 84% | 1.1% |
| රථවාහන | 87% | 1%< |

මූලාශ්‍රය: United Nations Human Development Report 1998

ඉහත සංඛ්‍යා සටහන්වලට අනුව ගෝලීය පරිභෝජනය කෙතරම් දුරට සමාජ අසමානතාව නිර්මාණය කර තිබේ ද? යන්න පැහැදිලි වේ. ගෝලීය පරිභෝජනය සම්බන්ධයෙන් කෙරෙන අධ්‍යයනයන් හි දී ගෝලීය පරිසර ප්‍රශ්නවලට සත්‍ය වශයෙන් ම වගකිව යුත්තේ සංවර්ධනය වෙමින් පවතින රටවල වැඩි වන ජනගහනය ද? උතුරේ රටවල සුඛවිහරණ පරිභෝජනය ද? යන්න නූතන සමාජයේ විමර්ශනයට භාජනය කළ යුතු වැදගත් ප්‍රශ්න දෙකකි.

ආහාර නිෂ්පාදනය හා පරිභෝජනය පාරිසරික වෙනස්කම් ඇති වීම සඳහා බලපාන ප්‍රධාන කරුණු ය. ගෝලීය උණුසුම ඉහළ යාම ඇතුළු කාලගුණික වෙනස් වීම් සෘජුව ම මානව පරිභෝජනය හා බැඳේ. ගෝලීයකරණය සමග සෘජුව ම සම්බන්ධ වන ගෝලීය ධනවාදය සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. ධනය, බලය හිමි අතලොස්සක් වූ කේන්ද්‍රයේ රටවල් විසින් නිර්මාණය කර පවත්වාගෙන යනු ලබන ගෝලීය පරිභෝජනය, පරිභෝජන වාදයක් (Consumerism) බවට පත් ව ඇත. බ්‍රිතාන්‍ය විශ්වකෝෂයට අනුව පරිභෝජනවාදය යන්නෙහි නිර්වචනාත්මක අර්ථය පහත දක්වා ඇත.

> "නිෂ්පාදන, සේවාවන්, නිෂ්පාදන ක්‍රමවේදයන්, නිෂ්පාදන වල තත්ත්වය, අලෙවි කරුවන් සහ අලෙවි ප්‍රචාරණය පාලනය කිරීම ඉලක්ක කර ගනිමින් ගොඩනැගී ඇති සමාජ ව්‍යාපාර හෝ ප්‍රතිපත්ති පරිභෝජනවාදය යන්නෙන් අදහස් කෙරේ. මෙවැනි පාලනයන් ආයතනික, නෛතික, ස්වෙච්ඡාමය හෝ පාරිභෝගික බලපෑම් මත ගොඩ නැගුණ ක්‍රමවේදයක් විය හැකිය" (The New Encyclopaedia Britanica, Vol, 03).

ඉහත නිර්වචනාත්මක අර්ථයෙන් නූතන පරිභෝජනවාදයේ බැරෑරුම් කම තේරුම්ගත නො හැකි ය. ඊට හේතුව නිර්වචනයට අනුව නම් පරිභෝජනවාදය පාරිභෝගිකයාට මෙන් ම පරිසරයට ද හිතකරය. නමුත් නූතන පරිභෝජනවාදය මීට වඩා අනර්ථකාරී ය. එය උතුරේ ධනවත් රටවල් විසින් පවත්වාගෙන යනු ලබන ධනවාදයේ පරිභෝජන ආකෘතිය යි. එහි දී පරිසර තත්ත්වයන් හෝ සෞඛ්‍ය සාධාරණත්වයන් තත්ත්වයන් සැලකිල්ලට නොගැනේ. ඔවුන්ගේ

දේශපාලන, ආර්ථික බලය මඟින් ගෝලීය වශයෙන් පරිභෝජන ක්‍රමයක් (Global consumption pattern) නිර්මාණය කර ඇත. රොබ් (2004:123) ට අනුව එය නූතනයේ එක්තරා ආකර වූ ආගමකි. භාණ්ඩ නිෂ්පාදනය හා බෙදා හැරීමේ පූර්ණ බලය ඔවුන් හිමිකර ගෙන ඇත. ගෝලීය වෙළෙඳපොල ප්‍රචාරණය හා වෙළෙඳ දැන්වීම් මඟින් පාරිභෝගික ආකල්ප හා රුචිකත්වයන් වෙනස් කරමින් පවතී. ගෝලීය පරිභෝජනවාදයේ ව්‍යාප්තියත් සමග සංවර්ධනය වෙමින් පවත්නා රටවල සාම්ප්‍රදායික පරිසර හිතකාමී පරිභෝජන ක්‍රමවේදයන් සංවර්ධිත රටවල පරිභෝජන ආචාර ධර්මවල ග්‍රහණයට නතුවීම ඛේදජනක සිදු වීමකි.

ගෝලීය පරිභෝජනය විශ්ලේෂණය කිරීමේ දී සැළකිය යුතු අංශ කිහිපයක් ෂාහ් (Shah, 2004) පෙන්වා දෙයි. එනම්,

- නූතනයේ අප භාවිත කරන බොහෝ භාණ්ඩවල සත්‍ය නිෂ්පාදකයා හෝ සම්පත් මූලයන් හඳුනයි ද?
- ගෝලීය භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලිය තුළ දී පරිසරයට, පුද්ගලයාට හා සමාජයට සිදු වන බලපෑම සැළකිල්ලට ගනී ද?
- නූතන පරිභෝජනය ද පරිසරයට, සමාජයට, පුද්ගලයාට වන බලපෑම සැළකිල්ලට ගනී ද?
- අපගේ පරිභෝජන තීරණ ගැනීමේ දී බලපෑම් කරනු ලබන රැගුම් කරුවන් කවුරුහු ද?
- අත්‍යවශ්‍ය සහ සුඛෝපභෝගී දෑ කවරේ ද?
- පරිභෝජන ආකල්ප වෙනස්වීම නිසා සමාජ වෙනස්වීම් ඇති වන්නේ කෙසේ ද?
- වෙළදාම සහ අළෙවිකරණ ක්‍රමවේදය විසින් පරිභෝජනය කළ යුත්තේ කුමක් ද?, කොපමණ ප්‍රමාණයක් පරිභෝජනය කළ යුතු දැයි තීරණය කිරීම
- දුප්පතුන්ගේ පරිභෝජන හැකියාවට, පරිභෝජන සංස්කෘතියට සහ රුචිකත්වයට සිදු කරන්නේ කවර ආකාරයේ බලපෑමක් ද?
- භෞතික අගයන් පුද්ගල අන්තර් සම්බන්ධතාවට බලපාන්නේ කෙසේ ද?

යන කරුණු විශ්ලේෂණය නොකොට නූතන පරිභෝජන ක්‍රමය තේරුම් ගත නො හැකි ය (Shah 2004: 66-82). ඉහතින් සඳහන් කරන ලද ආකාරයට නූතනයේ ගෝලීය පරිභෝජනය හා පරිභෝජන වාදය පිටුපස සිටින ගාමක බලය වන්නේ ගෝලීය වෙළෙඳපොල හැසිරවිය හැකි මූල්‍ය හා දේශපාලන බලය හිමි බලවේගය යි. ෂාහ් දක්වන ආකාරයට නූතන ගෝලීය පරිභෝජනයේ දැකිය හැකි ලක්‍ෂණ කිහිපයකි.

- ☐ අසමාන පරිභෝජනය (Inequality consumption)
- ☐ දූෂිත භාණ්ඩ පරිභෝජනය සහ යමෙකු විනාශ කිරීමේ ක්‍රමවේදයන් (භාණ්ඩ) නිර්මාණය කිරීම

- සියලු දෙනාගේ මූලික අවශ්‍යතා සපුරාලීමේ පරමාර්ථයට වඩා ඉල්ලුම කළ හැකි, පැහැදිලිව හඳුනාගත හැකි පාරිභෝගික පිරිස පමණක් ඉලක්ක කරමින් භාණ්ඩ නිෂ්පාදනය සිදු වීම
- දුප්පතුන්ගේ නිෂ්පාදන දුර්වල කරන භාණ්ඩ නිෂ්පාදනය සිදුවීම වශයෙනි (Shah ,2004:82).

ගෝලීය පරිභෝජනයේ මෙම සාහසිකත්වය පැහැදිලි කරන Bandarage (1997) ට අනුව,

> "ගෝලීය ජනගහනයෙන් පහළ ම 20% ක් වූ දරිද්‍රතාවේ ම ගිලී ජීවත් වන පංතියට කිසිසේත් ප්‍රමාණවත් ආහාර හෝ බීමට පිරිසිදු ජලය හෝ නොමැත. එහි ප්‍රතිඵලයක් වශයෙන් එම පිරිස අතර මන්දපෝෂණය හා දිළිඳු බව හා සම්බන්ධ රෝග බහුල ය. බඩගින්න නිසා දිනකට 3500 ක් ළමයින් මිය යන්නේ මොවුන් අතර ය. ගෝලීය ආහාර පරිභෝජනයේ ඊළඟ මට්ටම ඇත්තේ ලෝකයේ බිලියන 3.4 ක් පමණ වන ධාන්‍ය ආහාරයට ගන්නෝ ය. ඔවුහු ප්‍රමාණවත් කැලරි අවශ්‍යතාව ද, ශාක මූලික ප්‍රෝටීන් ද සහිත පෝෂ්‍යදායි ආහාර ගනිති. මෙම සමබර මැද පිළිවෙතෙහි වූ ආහාර පරිභෝජනය ගෝලීය ආදර්ශ මට්ටම විය යුතු ය. අවාසනාවට මෙන් තව තවත් රටවල් සංවර්ධිත රටවල ආකෘතිය අනුගමනය කිරීමත් සමඟ මොවුහු මෙතෙක් සාම්ප්‍රදායික ව අනුගමනය කළ ධාන්‍ය කෑම වේල අතහැර මස් මාංශ හා පිළියෙල කළ ආහාරවලට ඇබ්බැහි වෙති" (Bandarage,1997:229).

ගෝලීය පරිභෝජනවාදය තුළ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණය වන්නේ සංවර්ධිත රටවල ආහාර පරිභෝජන රටා ගෝලීය පරිභෝජන රටාව බවට පත් කිරීම ය. ඒ සඳහා දැඩි වෙළෙඳ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වේ (Shah,2004:84). අනෙක් අතට සංවර්ධනය වෙමින් පවතින රටවල ගෝලීය පරිභෝජනවාදය මුල් බැසගෙන ඇත්තේ බටහිර සංවර්ධිත රාජ්‍යයන්හි මෙන් පෘථුල ලෙස විහිද තිබෙන ඉසුරුමත් බවක් මැද්දේ නොව පෘථුල ලෙස ව්‍යාප්ත ව ඇති දරිද්‍රතාවක් මැද්දේ ය (හෙට්ටිගේ,2004:38). මේ නිසා ගෝලීය පරිභෝජනවාදය විසින් නිර්මාණය කරනු ලබන අසහනයන්ට මුහුණ දීමේ ඇති හැකියාව මෙම රාජ්‍යයන්ට අවම ය.

ගෝලීය පරිභෝජන හිණිමගේ ඉහළින් ම සිටින්නේ බිලියන 1.25 ක් වන මාංශභක්ෂකයෝ ය. ඔවුන් තමන්ට අවශ්‍ය කැලරි ප්‍රමාණයෙන් 40% ක් ලබා ගන්නේ පරිභෝජනය කරනු ලබන මස්වල මේදවලිනි. මේ නිසා ම ඉසුරුමත් බව හා සම්බන්ධ යයි කියවෙන රෝග වන හෘද රෝග, විවිධ පිළිකා හා දියවැඩියාව ආදී රෝගයන්ට මාංශභක්ෂකයෝ ගොදුරු වෙති. එහෙත් සමකාලීන මාංශ පරිභෝජනය ගෝලයේ සෞඛ්‍යයට මෙන් ම දුප්පතුන්ගේ පැවැත්මට ද තර්ජනයකි. මාංශ පරිභෝජනය කරන පිරිස ලෝකයේ ධාන්‍යවලින් ද 40% ක් පරිභෝජනය කරති. ඒ ඔවුන් ආහාරයට ගන්නා මස් සපයන සතුන්ට දීමට ගන්නා ධාන්‍යය යි. විශාල වශයෙන් ව්‍යාප්ත වන ගව පට්ටි නිසා වගා බිම් පමණක් නොව,,වනාන්තර ද හෙළි පෙහෙළි කරන අතර එම ඉඩම්වල දුප්පත්

මිනිසුන් ආහාරයට ගන්නා බෝංචි හා අනෙකුත් ධාන්‍ය භෝග වගා කිරීම ද වළකයි. තෘණ භූමි වශයෙන් හෝ ඉරිඟු වගාවන් සඳහා මේවා යොදා ගැනේ. එහෙත් මස් නිෂ්පාදනය කිරීමේ නූතන ක්‍රම ද සම්පත් පිරිහීමට හා පරිසර විනාශයට හේතු වේ (Durning, 1992:159). ඩර්නිං (1992:159-160) පෙන්වා දෙන පරිදි පාංශු ඛාදනයේ සිට භූගත ජලය අනවශ්‍ය ලෙස නළ මඟින් ඉවත් කර ගැනීම දක්වා වූ නූතන ගෝලීය කෘෂිකාර්මික පද්ධතිය විසින් ඇති කරන ලද පාරිසරික පීඩනයේ සැළකිය යුතු කොටසකට හේතුව වන්නේ මාංශ නිෂ්පාදනය යි. ඇමරිකාවේ ගව මස් නිෂ්පාදනයේ ආන්තික උදාහරණය ගෙන බලන කල ස්ටේක් රාත්තල් දෙකක් නිපැයීමට ධාන්‍ය රාත්තල් 10 ක් ද, ගැලසයින් ගැලුම් භාගයක බල ශක්තියක් ද උවමානා ය. මේ සිදු වන පාංශු ඛාදනය, ජල පරිභෝජනය, පළිබෝධනාශක හා පොහොර ඉවතට ගලා යාම, භූ ගත ජලය අඩු වීම හා මීතේන් හරිතාගාර වායූ පිට වීම ද නො සළකා හැර වෙයි.

## ගෝලීය ප්‍රවාහනය

ගෝලීය ප්‍රවාහන ක්‍රමය ද අසමාන හා තිරසාරත්වයෙන් තොර වූවකි. බණ්ඩාරගේ (2001) දක්වන ආකාරයට ගෝලීය ප්‍රවාහන හිණිමගෙහි පහළින් ම සිටින්නේ බිලියනයක් පමණ වූ කිසිම ප්‍රවාහන ක්‍රමයක් තෝරා ගැනීමට හැකියාව නැති පයින් ගමන් කරන හෝ ඉඳහිට සතෙකු පිට හෝ බසයක ගමනක් යන ජනයා ය. ප්‍රවාහන හිණිමගේ මැද පිරිස එනම් බිලියන තුනක් පමණ චීන, දකුණු ආසියා හා ලතින් ඇමරිකාවේ ජීවත් වන මොවුහු බස් සේවය හෝ පා පැදි මඟින් තම ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගනිති. මොවුන්ගේ ප්‍රවාහන මාධ්‍යය ලාභය, පාරිසරික වශයෙන් ද හිතකාමීය (බණ්ඩාරගේ, 2001:355-356).

> "එහෙත් ප්‍රවාහන ස්ථරයේ ඉහළින් ම සිටින පොහොසත් ම බාණ්ඩයේ ප්‍රවාහන පුරුදු එනම් මෝටර් රථ හා අහස් යානාවලින් ගමන් අවශ්‍යතා සපුරා ගන්නන් නිසා වැඩි වශයෙන් පරිසරයට බලපෑම් ඇති කරයි. මොවුන් මෙවැනි ක්‍රමයන්ට හුරුවී ඇත්තේ ඒවායෙහි කාර්යක්ෂමතාවට ම නොව තම සමාජ ජීවිතවල තත්ත්වය හා පංතිය පෙන්වීම සඳහා ය" (Veblen, 1899:21-33).

මෝටර් රථ, අහස් යානා, ශීතකරණ හා වායු සමීකරණ ඇතුළු උතුරේ මෙන් ම දකුණේ ද ධනවාදීන්ගේ සුඛ විහරණය සඳහා වූ භාණ්ඩ මාලාව දුප්පත් මිනිසුන් වැඩි වීමේ සංඛ්‍යාවට වඩා දැඩි තර්ජනයක් පරිසරයට එල්ල කරයි. එහෙත් නූතන පරිසර බිඳවැටීම් පිළිබඳ විග්‍රහ කරන මැල්තීසියානු න්‍යායවේදීන් දක්වන්නේ සංවර්ධනය වෙමින් පවත්නා රටවල වැඩි වන ජනගහනය පරිසර පිරිහීමට බලපාන ප්‍රධාන හේතුව වන බවයි. පශ්චාත් මැල්තීසියානු සංවර්ධනවේදීන් ඍජුවම චෝදනා එල්ල කරන්නේ සංවර්ධනය වෙමින් පවත්නා රටවල වැඩිවන ජනගහනය ගෝලීය ආහාර අර්බුදයට හා පරිසර බිඳවැටීමට හේතු වන බව පවසමිනි. නමුත් ඔවුහු ගෝලීය වශයෙන් පරිභෝජනයේ පවතින අසමානතාව හෝ සංවර්ධිත රටවල පරිභෝජන ආධිපත්‍ය කිසිසේත් ප්‍රශ්න නොකරයි.

බණ්ඩාරගේ (2001) දක්වන්නේ නූතනයේ ධනවතුන්ගේ මෝටර් රථයට දුප්පතුන්ගේ ජීවිතවලට වඩා වැඩි මූල්‍ය වටිනාකමක් තිබෙන බවයි. ඇමරිකා

ISSN 1800-1459

එක්සත් ජනපදයෙහි දිළින්දෙකුට මුළු ජීවිත කාලය ම නඩත්තු කර ගැනීමට අවශ්‍ය පිරිවැයට වඩා වැඩි මුදලක් මෝටර් රථයක් ගැනීමට හා එහි නඩත්තුවට අවශ්‍ය වෙයි. ඇමරිකා එක්සත් ජනපදයේ ගරාජයක් බලා ගන්නා පිරිමි සේවකයෙකුගේ පැයක වැටුප ළමා සුරැකුම් මධ්‍යස්ථානයක සේවිකාවන්ගේ පැයක වැටුපට වඩා වැඩි ය.

- "ඇය තව දුරටත් දක්වන්නේ ලෝකය පුරා ම කාබන්ඩයොක්සයිඩ් විමෝචනයෙන් 13% ක ට ද වායු දූෂණයට ද, අම්ල වැසිවලට ද වසරකට සිදු වන මරණීය අනතුරු මිලියන හතරකට ද කෙලින් ම වගකිව යුත්තේ මොටෝ රියයි. මෝටර් රථ සමාගම් දිගින් දිගට ම රථ වෙළෙඳාම වර්ධනය කර ගෙන යන නමුදු ග්‍රහ ලෝකයේ රථ සඳහා වූ ඉසුලුම් ධාරිතාව ඉක්මනින් පිරීගෙන යයි" (බණ්ඩාරගේ, 2001:358).

## ගෝලීය සම්පත් භාවිතය

ගෝලීය පරිභෝජන ක්‍රියාවලියේ සම්පත් භාවිතය මගින් ද විශාල පංති විෂමතාවක් හා බල විෂමතාවක් නිර්මාණය කර ඇත. බොහෝ විට තුන්වන ලෝකයේ හා ඌනම දියුණු රටවල ග්‍රාමීය ජනගහනය ඔවුන්ට කිට්ටුම පරිසරයෙන් ඉතා සීමිත සම්පත් ප්‍රමාණයකින් සිය අවශ්‍යතා පිරිමසා ගනිති. මෙම ප්‍රමාණය බිලියන එකක් පමණ වේ. ඔවුන් භුක්ති විඳින සම්පත් ප්‍රමාණය දක්වන්නේ නම් ධාන්‍ය රාත්තල් භාගයක්, දර රාත්තල් දෙකක් පමණ හා ඔවුන්ගේ සතුන්ට දිනකට අවශ්‍ය ආහාරත් ඒ දිනවලට ලබා ගෙන ය. මෙයින් වැඩි කොටසක් අලුත් කළ හැකි ස්වයං නිෂ්පාදන සම්පත් ය (Durning, 1992:158). ඩර්නිං (1992) තවදුරටත් පෙන්වා දෙන්නේ ඉන්දියාව, ඉන්දුනීසියාව වැනි රටවල ඒක පුද්ගල වානේ පරිභෝජනය වසරකට කිලෝග්‍රෑම් 50 ට ත් අඩු ය. වර්ෂයකට වානේ කිලෝග්‍රෑම් 50 - 100 ත් අතර ප්‍රමාණයක් භුක්ති විඳින මෙක්සිකෝව හා තුර්කිය වැනි රටවල වැසියෝ ලෝක සම්පත් භාවිත හිණිමගේ මැද කොටසට අයත් වෙති. එමෙන් ම ඔවුන්ගෙන් එක් අයෙකු වසරකට ගල් අඟුරු කිලෝග්‍රෑම් 1000 ක් හා කඩදාසි කිලෝග්‍රෑම් 33 ක් ද භාවිත කරයි. ලෝක අමුද්‍රව්‍ය හා සම්පත් භාවිතයෙන් 75% ක් භුක්ති විඳින්නේ කාර්මික රටවල් ය.

බණ්ඩාරගේ (2001) දක්වන ආකාරයට ලෝකයේ කාර්මීකරණය වූ හතරෙන් පංගුවෙහි ජීවත් වන සාමාන්‍ය පුරවැසියන් සංවර්ධනය වන ලෝකයේ මිනිසෙකු මෙන් 15 ගුණයක් කඩදාසි භාවිත කරයි. වානේ භාවිතය ද එමෙන් දස ගුණයකි. ඉන්ධන දොලොස් ගුණයකි. නැවතත් දරුණුම තත්ත්වය පවතින්නේ එක්සත් ජනපදයේ ය. එහි එක් පුද්ගලයෙක් දිනකට ඔහුගේ ශරීරයේ බර තරම් වූ මූලික ද්‍රව්‍ය පාවිච්චි කරයි. ඔවුන්ගේ පරිභෝජන ප්‍රමාණය පැට්‍රෝලියම් සහ ගල් අඟුරු රාත්තල් 40ක්, අනෙක් ඛණිජ වර්ග රාත්තල් 30ක්, කෘෂි නිෂ්පාදන රාත්තල් 20 ක් සහ වන නිෂ්පාදන රාත්තල් 19 ක් වශයෙන් දැක්විය හැකිය (බණ්ඩාරගේ, 2001:359). ගෝලීය සම්පත් භාවිත කරන ප්‍රමාණය අනුව ද කේන්ද්‍රයේ අතලොස්වක් වූ ධනවත් රටවල ආධිපත්‍යයක් පවතින බව ඉහත නිදර්ශන වලින් මොනවට පැහැදිලි වේ.

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 96-115
ISSN 1800-1459

## පරිභෝජනයේ නූතන ක්‍රමය

මිහිතලයේ ජීවීන් සියලුදෙනා ම සිය පැවැත්ම සඳහා අරගල කරති (Struggle for Survival). ආහාර, නිවාස, ඇඳුම් වැනි මූලික අවශ්‍යතාවනගේ සිට ග්‍රහ ලෝක තරණය දක්වා වූ අවශ්‍යතාවයන් සඳහා යොමු වී ඇත්තේ පැවැත්ම සඳහා ය. අන්‍ය සත්ව සමූහයාට ඇත්තේ ජීව විද්‍යාත්මක අවශ්‍යතා පමණි. එනම් බඩගින්න, පිපාසය, මෛථුනය වැනි සහජ අවශ්‍යතාවන් ය. නමුත් මානව සත්වයා ඉන් එහා දිව යන සංකීර්ණ අවශ්‍යතා ඇත්තෙකි. එනම් සංස්කෘතික අවශ්‍යතා ද ඔහුට ඇත. මෙම අවශ්‍යතා ළඟා කර ගැනීම සඳහා මිනිසා හැම විට ම තරඟකාරීව යත්න දරයි. සුප්‍රසිද්ධ මනෝ විද්‍යාඥයෙකු වන "එබ්‍රහම් මැස්ලෝ" පෙන්වා දෙන්නේ මිනිසුන්ගේ අවශ්‍යතා ධූරාවලියක ආකාරයට සැකසෙන බව ය. එය පහත සඳහන් පරිදි ය.

| | |
|---|---|
| ඉහළ අවශ්‍යතා | 5. ආත්ම පරිපූර්ණත්වය<br>4. සම්මානනීයත්වය |
| ද්විතීයික | 3. සමාජීය අවශ්‍යතා - ආදරය, මිත්‍රයින්<br>2. ආරක්‍ෂාව - වැඩපොලේ හෝ සමාජයේ සිටින විට අවශ්‍ය ආරක්‍ෂාව |
| මූලික අවශ්‍යතා | 1. ප්‍රථමික අවශ්‍යතා - ආහාර, ඇඳුම්, නිවාස, ලිංගිකත්වය |

මූලාශ්‍රය (Masllaw, 2006:61 ).

ඉහත අවශ්‍යතා ධූරාවලිය විශ්ලේෂණය කිරීමෙන් දැකිය හැක්කේ මානව අවශ්‍යතාවල අනුපිළිවෙළකි. මැස්ලෝට අනුව මෙම අවශ්‍යතා ක්‍රමානුකූල ව සපිරේ නම් පුද්ගලයා පරිපූර්ණත්වයෙන් යුක්ත ය. නමුත් මානව අවශ්‍යතා මෙවැනි ධූරාවලියක් ආකාරයට පිහිටයි ද? අනෙක් අතට එකවර අවශ්‍යතා දෙකක් හෝ කිහිපයක් මතුවිය නො හැකි ද? යන ප්‍රශ්න මැස්ලෝගේ අවශ්‍යතා ධූරාවලියට ඇති විවේචනයන් ය. මාර්ෂල් සහ්ලින්ස් (1972), "The Original Afluent Society" කෘතිය රචනා කරමින් පෙන්වා දෙන්නේ මිනිසුන්ට පරිපූර්ණ ජීවිතයක් ගත කිරීම සඳහා මුදල් හෝ භාණ්ඩ එතරම් අවශ්‍ය නො වන බව යි. නූතන මිනිසා හැකිතාක් භාණ්ඩ හා ද්‍රව්‍යයන් එක් රැස් කරමින් හා පරිභෝජනයෙන් සංතෘප්ත වීම අපේක්ෂා කරයි. ඒ නිසා ම නූතන පරිභෝජනය තුළ ඇති නැති පරතරය වේගවත් වී ඇත. එපමණක් නොව නූතන පරිභෝජන ක්‍රමයේ ප්‍රතිඵලයක් ලෙස පුද්ගලයා තුළ අතෘප්තිය හා අසහනය වර්ධනය වී ඇති බව පෙන්වා දෙන සලින්ස් දඩයමෙන් හා එලවැළ එක් රැස් කරමින් ජීවත් වූ සරළ සමාජවල මිනිසුන් නූතන සමාජයට වඩා ඉතා සංතෘප්ත ජීවිතයක් ගත කළ බව පෙන්වා දේ. පොදු පරිභෝජනය අනෙකා පිළිබඳ හැඟීම, පරිසර හිතකාමී ජීවන රටාව එම සමාජවල පොදුවේ දැකිය හැකි ලක්‍ෂණයක් බව පෙන්වා දෙයි (Shalins, 1972:79-98).

"අනෙක් අතට වැඩිහිටි දඩයම් කරන්නෝ දවසේ පැය 2 -5 අතර කාලයක් ආහාර රැස්කිරීම සඳහා ගත කරති. අනෙක් කාලය තුළ ඔවුහු සිය අඹුදරුවන් සමඟ සමීපව කටයුතු කළහ. සියලු දෙනා රැස් වී කවි, ගීත ගායනා කරමින් එකිනෙකා සතුටු සාමීචියේ යෙදුණහ. චිත්‍ර ඇඳීම, කථාන්දර කීම වැනි සෞන්දර්යාත්මක ලෙස විවේකය අර්ථවත් කිරීම සිදු කළහ. ලොව පුරා සරළ සමාජයන්වල මෙම තත්ත්වය දැකිය හැකි විය (Shalins, 1972:79-98).

සරළ සමාජවල මිනිසුන්ගේ ජීවන ශෛලිය තුළ දුප්පත් පොහොසත් භේදයක් නො වීය. පෞද්ගලික දේපල රැස් කිරීමක් නො වීය. පරිසර හිතකාමී ජීවන ශෛලියක් ඔවුනට පැවතුණි. අනෙක් අතට පාරිසරික ව ඇති වූ ගැටලු තේරුම් ගැනීම සහ ඒවාට පිළියම් සෙව්වේ පරිසර හිතකාමී ආකාරයට ය. උදාහරණ ලෙස ගං වතුර, නියඟ, දඩයම් හිඟවීම වැනි ව්‍යසනයන් ඔවුන් තේරුම් ගත්තේ දෙවියන් හෝ මියගිය ඥාතීන් කෝප වීමේ ප්‍රතිඵල වශයෙනි. ඒ වෙනුවෙන් පරිසර හිතකාමී අභිචාර විධිවල ඔවුහු නිරත වූහ.[3]

නමුත් පසුගිය දශකවල සිදු වූ ධනවාදයේ වර්ධනයත් සමග මානව පරිභෝජන රටාව දැඩි ලෙස වෙනස්විය. අධිපරිභෝජනය ධනවාදයේ අලුත් සාරය (New Spirit of Capitalism) බවට පත්ව ඇති අතර, පාරිසරික වශයෙන් අලුත් කළ නොහැකි සම්පත් හායනය සඳහා බලපාන ප්‍රධාන සාධකය වී ඇත්තේ ධනවාදී පරිභෝජනය යි (Beck, 1992:148-149).

මැස්ලෝගේ අවශ්‍යතා ධූරාවලිය විවේචනය කරමින් සලින්ස් තව දුරටත් පෙන්වා දෙන්නේ නූතන සමාජයේ ඇති පරිභෝජනය දරිද්‍රතාව සමාජය විසින් නිර්මාණය කරන ලද්දක් වන අතර දිළිඳුකම සමාජ තත්ත්වයක් වී ඇති බව ය. සරළ සමාජවල මිනිසුන් මෙවැනි පරිභෝජන දරිද්‍රතාවෙන් හෝ දුෂ්පෝෂණයෙන් හෝ පරිභෝජන අනාරක්ෂාවෙන් හෝ පීඩා නො විඳි අතර නූතන සමාජයේ මිනිසා මෙවැනි ප්‍රශ්නවලට මුහුණ පා සිටින්නේ තරඟකාරී භාණ්ඩ පරිභෝජනය හා රැස්කිරීමේ ක්‍රියා පිළිවෙත නිසා ය. එම පිළිවෙත නිසා මැස්ලෝ දක්වන ආකාරයට පුද්ගලයා සංතෘප්ත නො වන බවත්, ඒ වෙනුවට පුද්ගලයා හා සමාජය තුළ අසහනය හා අසංතෘප්තිය වර්ධනය වන බවත් සංතෘප්ත ජීවිතයක් ගත කිරීම සඳහා වැඩියෙන් මුදල් හෝ භාණ්ඩ අවශ්‍ය නො වන බවත් සරළ සමාජ පිළිබඳ විශ්ලේෂණය කරමින් සලින්ස් පෙන්වා දෙයි. නමුත් සලින්ස් ගේ සරළ සමාජ පිළිබඳ විග්‍රහ නූතන සමාජය විශ්ලේෂණය කිරීම සඳහා යොදා ගැනීම පිළිබඳව ඔහුට විවේචන එල්ල වී ඇත.

## නිර්ලෝභී පරිභෝජනය බැහැර කිරීම හා විවේකය

නූතන සමාජයේ පරිභෝජන රටාව පිළිබඳ අදහස් දක්වන තර්ස්ටන් වෙබ්ලෙන් (Thorstein Veblen) පවසන්නේ නූතන පරිභෝජන ක්‍රමය අසහාය තත්ත්වයට පත්ව ඇති බොරුවක් වන බව ය (Sophisticatelies). 1899 දී රචනා කරන ලද "Theory of the Leisure Class" කෘතියෙන් ඔහු මෙම අදහස් දක්වයි. නූතන

[3] ශ්‍රී ලංකාවේ ආදිවාසි ජනතාවගේ ජනප්‍රිය අභිචාර ක්‍රමයක් වන 'කිරි කොරහේ නැටීම' මේ සඳහා කදිම නිදසුනකි

සමාජයේ මිනිසා අනෙකා අභිබවා නැගී සිටීමට හා කැපී පෙනීමට උත්සාහ ගනියි. හැම විට ම තමා අවට ලෝකය හා තම පංතිය තුළ තරගකාරීව ක්‍රියා කිරීමට උත්සාහ ගන්නේ සමාජය තුළ හා තම පංතිය තුළ කැපී පෙනීමේ අවශ්‍යතාව මත ය. නූතන සමාජයේ මිනිසාගේ ජීවන ශෛලිය වෙබ්ලෙන් අංශ තුනක් ඔස්සේ විග්‍රහ කරයි. එනම්,

1. නිර්ලෝභී/ උජාරු පරිභෝජනය (Conspicuous consumption)
2. නිර්ලෝභී/ උජාරු බැහැර කිරීම (Conspicuous Waste)
3. නිර්ලෝභී/ උජාරු විවේකය (Conspicuous Leisure) (Bell, 2004: 35-36).

නූතන සමාජයේ පරිභෝජනය පිළිබඳ අදහස් දක්වන වෙබ්ලෙන් පෙන්වන්නේ එය උජාරු නැතහොත් නිර්ලෝභී පරිභෝජනයක් වන බව යි. පරිභෝජනය හුදෙක් මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පමණක් නො වන අතර එමඟින් පුද්ගලයාගේ සමාජ බලය හා තත්ත්වය ප්‍රකාශ කිරීමට ද උත්සාහ ගනී. මිල අධික නිවාස, මෝටර් රථ, ඇඳුම්, පරිගණක, බෝට්ටු, වායු සමීකරණ, දියුණු ගෘහ විදුලි උපකරණ ආදිය නූතන මිනිසා පරිභෝජනය කරන්නේ අනෙකා ඉදිරියේ තම සමාජ බලය හා තත්ත්වය පෙන් වීමට ය. එසේ නො වුණු හොත් තම සමාජ බලය හා ගෞරවය හීන වී යන්නේ ය යන්න ඔවුන් තුළ ඇති වන මානසිකත්වය බව වෙබ්ලෙන් දක්වයි. මේ ක්‍රමය තුළ තරගකාරීව අනෙකා අනුකරණය කිරීම නිසාත් හැකිතාක් වටිනා ද්‍රව්‍ය රැස්කර තැබීමට දරන උත්සාහය නිසාත් පාරිසරික සම්පත් කෙරෙහි දැඩි පීඩනයක් එල්ල කරයි. මෙහි දී වැදගත් කරුණක් වන්නේ මෙවැනි කැපීපෙනෙන පරිභෝජනයේ දී පවතින සමාජ ප්‍රතිමාණ අභියෝගයට ලක් වීමයි[4] (Bell, 2004).

> "ඉස්මතු වී පෙනෙන ආකාරයෙන් පරිභෝජනයේ යෙදෙන්නේත් විභූතිමත් ලෙස එය ප්‍රදර්ශනය කරන්නේත් මධ්‍යම පාංතිකයෝ ය. හොඳ කල දවසක් ගත කරන්නවුන් ලෙස හා ජය ගත්තවුන් ලෙස පෙනී සිටින්නෝ ද ඔවුහු ය. මිලයට ගැනීමෙහි ලා තමන්සතු ශක්තිමත් ඉඩ ලැබෙන ප්‍රමාණයට සෙස්සෝත් ඔවුන් අනුකරණය කරන්නට පුරුදු වෙති. ඒ සමග ම අලුතෙන් මතුවීගෙන එන සමාජ රටාව අවිචාරයෙන් පිළිගැනීමක් බවට පත්වී තිබේ" (හෙට්ටිගේ, 2004:16).

වෙබ්ලෙන් උපුටා දක්වන බෙල් (2004) නිර්ලෝභී නැතහොත් උජාරු බැහැර කිරීම වශයෙන් දක්වන්නේ නව නිෂ්පාදන වෙළෙඳ පොළට පැමිණෙන විට ඒ වන විට භාවිත කරමින් සිටි ද්‍රව්‍ය බැහැර කොට නවෝත්පාදක (Innovations) මිල දී ගැනීමට යොමු වීමයි. නමුත් බැහැර කරන භාණ්ඩ සම්පූර්ණයෙන් පිරිහුණු ඒවා නො වේ. මේ තත්ත්වය යටතේ නව නිෂ්පාදන මිල දී ගැනීම සඳහා පාරිභෝගිකයින් තරගකාරීව පෙළඹෙන්නේ තම සමාජ තත්ත්වය හා බලය ආරක්ෂා කර ගැනීම සඳහා ය (Bell, 2004:74). උදාහරණ වශයෙන් මෝටර් රථ සඳහා පවතින සමාජ තත්ත්වය පෙන්වාදිය හැකි ය.

---

[4] බෞද්ධයින් මස් අනුභවය ප්‍රාණඝාතයට අනුබලයක් වශයෙන් සලකයි. නමුත් නූතනයේ මස් අනුභවය සාමාන්‍යකරණයටත්, පංතිකරණයටත් ලක් වූ ආහාරයකි. ෆ්‍රයිඩ් රයිස් සහ චිකන් සාමාන්‍ය ආහාරයක් බවට පත්ව ඇත. ඒ අනුව නූතන කැපීපෙනෙන පරිභෝජනයේ දී පවතින ප්‍රතිමාණ අභියෝගයට ලක්වන බව පැහැදිලි වේ.

UNFA State of the World Population: 1990 වාර්තාව 1950 හා 1980 අතර දී ලෝකයේ පාවිච්චි වන මෝටර් රථ සමුදාය හත් ගුණයකින් වැඩි වූ බව ද එම කාල සීමාව තුළ ම මිනිස් සංඛ්‍යාව වැඩි වූයේ දෙගුණයකින් පමණක් බව ද කියයි. එමෙන් ම 1990 දී මිලියන 400 ක් වූ මෝටර් රථ සංඛ්‍යාව ඇස්තමේන්තු වලට අනුව ඊළඟ අවුරුදු 20 තුළ මිලියන 700 දක්වා වඩි වෙතැයි අපේක්ෂා කරන අතර එහි වැඩි වීමේ වේගය ජන ගහණය වැඩි වීමේ වේගය මෙන් දෙගුණයක් බව පෙන්වා දෙයි. නමුත් බණ්ඩාරගේට (2001) අනුව තුන්වන ලෝකයේ අයට හිමි වී ඇත්තේ මෝටර් රථවලින් 12% ක් පමණි. එම වාර්තා දක්වන්නේ ජනගහනය වැඩි වීම මෝටර් රථ ඉල්ලුම වැඩි වීමට හේතු වන බව ය. එහෙත් ඔවුන් ඒ පිටුපස ඇති පාරිසරික ලෙස හානි කර ඉසුරුමත් බටහිර ජීවන ශෛලියට අනුවර්තනය වීමට සමාජ කණ්ඩායම් හා පුද්ගලයින් පොළඹ වන ගෝලීය ආර්ථික රටාව ප්‍රශ්න නො කරයි (බණ්ඩාරගේ, 2001:354). ඉහත උදාහරණය මඟින් පෙනේන්නේ උජාරු බැහැර කිරීම හා එහි පාරිසරික බලපෑමේ බැරෑරුම්කම යි.

වෙබ්ලෙන් (1899) දක්වන ආකාරයට උජාරු පරිභෝජනය හා උජාරු බැහැර කිරීම තරම් උජාරු විවේකය පරිසරයට තර්ජනයක් නො වේ. එය පුද්ගලයා විවේකය ගත කරන ආකාරය අනුව තීරණය වේ. පොත් කියවීම, චිත්‍රපට නැරඹීම, මල් වැවීම වැනි විවේකය අර්ථවත් වන ක්‍රියාවන් හි ඇතැමෙක් නිරත වන විට තවකෙකු සතුන් දඩයම් කිරීමට හා මෝටර් රථ පැදවීමට ද යොමු විය හැකි ය. මෙහි දී සතුන් දඩයම හා මෝටර් රථ පැදවීම කලින් කී ක්‍රියාවන්ට වඩා පරිසරයට අහිතකර ය. අනෙක් අතට වෙබ්ලෙන් දක්වන්නේ විවේකය ගත කිරීමට දුර බැහැර ප්‍රදේශවල සංචාරය කිරීම සුව පහසු නේවාසිකාගාර, ප්‍රනීත භෝජන ආදීයට යොමු වීම නිසා පරිසරයට වන බලපෑම වැඩි වන බව ය. කෙටියෙන් දක්වන්නේ නම් නූතන සමාජයේ පරිභෝජනය නාස්ති කාරය. බැහැර කිරීම මෙන් ම විවේකය ද නාස්තිකාර ය. පරිභෝජනය බැහැර කිරීම හා විවේකය නූතන සමාජයේ පරිසරයට දැඩි බලපෑම් එල්ල කරන්නකි.

## තත්ත්වීය භාණ්ඩ (Positional Goods)

ලිපියේ මෙම කොටසින් උත්සාහගෙන ඇත්තේ පරිභෝජන භාණ්ඩ පිළිබඳ සමාජවිද්‍යාත්මක විශ්ලේෂණයක් සැපයීමට ය. ආර්ථික විද්‍යා චින්තකයෙකු වූ ෆ්‍රෙඩ් හර්ච් (Fred Herch) තත්ත්වීය භාණ්ඩ සම්බන්ධයෙන් දක්වන අදහස් ද බොහෝ සෙයින් වෙබ්ලෙන් ගේ අදහස් හා සමාන වේ. ඔහුට අනුව නූතන පරිභෝජන ක්‍රමය තුළ ඇතැම් භාණ්ඩ හිඟ වන්නේ වෙළෙඳ පොළ ඉල්ලුම හා සැපයුම අතර පවතින ආර්ථික විද්‍යා නියමට වඩා වෙනස් වූවක් නිසා ය. එනම් තත්ත්වීය භාණ්ඩ පරිභෝජනය යි. තත්ත්වීය භාණ්ඩයක දැකිය හැකි ලක්ෂණ කිහිපයක් හර්ච් පෙන්වා දෙයි. සීමිත සැපයුම, ඒවා ලබා ගැනීමට පවතින අපහසුව, ඉහළ මිල සහ ඒවා භාවිතය සමාජ තත්ත්වය හා ගෞරවය ඉහළ යාමට හේතු වීම යන ලක්ෂණයන් ය (Bell, 2004). පරිභෝජනය තුළ තත්ත්වීය භාණ්ඩ සඳහා කදිම නිදසුනක් දක්වන හර්ච් ප්‍රකාශ කරන්නේ චීනයේ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම තුළ කඟවේන අඟ යොදා තැනූ අත් ආධාරකය පුරුෂයින්ගේ පුරුෂත්ව ගති ලක්ෂණ (Masculine) විදහා දැක්වීම සඳහා භාවිත වූ බවත්

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 96-115
ISSN 1800-1459

නූතනයේ දී ද එවැනි අත් ආධාරක භාවිතයෙන් ඔවුන් තම පුරුෂත්ව පෙනුම ලබා ගැනීමට භාවිත කරන බවත් ය. නූතනයේ එවැනි ආධාරකයක මිල ඇමරිකානු ඩොලර් 40,000ක් පමණ වන අතර මේ නිසා ම චීනයේ වාර්ෂික ව විශාල ප්‍රමාණයක් කඟවේනුන් විනාශවීමේ තර්ජනයට ලක්ව ඇත. ශ්‍රී ලංකාවේ ඇත් දළ හා කළුවර දැවයෙන් සාදන ලද ගෘහ භාණ්ඩ ද තත්ත්වීය භාණ්ඩයන්ට නිදසුන් ය. මෙම භාණ්ඩ එක් අතකින් දුර්ලභ වන අතර ඒ නිසා ම ඒ තුළ සමාජ තත්ත්ව ප්‍රකාශන සංකේතමය ගුණය අන්තර්ගත වේ.

නූතන ගෝලීය පරිභෝජනය තුළ මෝටර් රථ, අහස් යානා, ශීතකරණ, වායුසමීකරණ ආදී උතුරේ ධනවතුන්ගේ සුඛවිහරණ භාණ්ඩ එම රටවල පමණක් නොව දියුණුවෙමින් පවත්නා රටවල මිනිසුන්ගේ සමාජ තත්ත්වය පෙන්වන භාණ්ඩ හෙවත් සංකේත අවකාශයන් බවට ද පත්ව ඇත. මෙම භාණ්ඩ පරිභෝජනය කිරීමෙන් අත්පත් කර ගත හැකි සුවපහසුව හා සමාජ තත්ත්වය පිළිබඳ සිතනවා විනා එයින් වායුගෝලයට එක්වන $Co_2$ හෝ CFC වැනි වායු පිළිබඳ කිසිවෙක් නො සිතති.

## පරිභෝජනයේ භෞතිකවාදී සංස්කෘතිය

පරිභෝජනයේ භෞතික වාදී සංස්කෘතිය ගෝලීය තරගකාරී පරිභෝජනය විසින් නිර්මාණය කරනු ලැබූවකි. තරගකාරි ව භාණ්ඩ මිල දී ගැනීම, රැස්කිරීම, ස්පර්ශය හා ආශ්වාදය යන සෑම අංශයක් ම පරිභෝජනයේ භෞතික සංස්කෘතිය නියෝජනය කරන සාධකයෝ වෙති. ගෝලීය වෙළඳ ප්‍රචාරණය ගෝලීය ජනගහනයටත් ආර්ථික නිපැයුම් වලටත් වඩා සීඝ්‍රයෙන් වර්ධනය වේ (බණ්ඩාර, 2001:234). 1950 හා 1990 අතර කාලය තුළ ගෝලීය වෙළඳ ප්‍රචාරණය දළ වශයෙන් හත් ගුණයකින් වැඩි වී ඇත. එය ගෝලීය ජනගහනය වැඩිවීමට වඩා තුන් ගුණයක වැඩි වීමකි (බණ්ඩාර, 2001:234-235). විශේෂයෙන් ම ගෝලීය වෙළඳ ප්‍රචාරණය ඍජුව ම පාරිභෝගික ආකල්ප වෙනස් කිරීමට සමත් ව ඇත. සංස්කෘතික සීමා, භූගෝලීය සීමා, පාරිසරික සීමා හෝ භාෂාමය සීමාවක් නොමැතිව ක්‍රියාත්මක වන ගෝලීය වෙළඳ ප්‍රචාරණය මගින් ජීවිතය භාණ්ඩකරණයට (Materialize) පත් කොට ඇත. නූතනයේ ජාතික හා ජාත්‍යන්තර සමාගම් විසින් රූපවාහිනියෙන් පෝෂණය වන බාල පරම්පරාවට පරිභෝජනවාදය, පුද්ගලවාදය හා තරඟකාරීත්වයෙන් පිට ජීවිතයක් පිළිබඳ අවබෝධයක් නොමැත. ගෝලීය වෙළඳ ආර්ථිකය ආත්ම විශ්වාසය හා සැබෑ නිර්මාණශීලී බව අධෛර්යට පත් කරයි. හැම දෙනා ම ඉල්ලුම් කරන්නේ ඒකාකාර භෞතික සම්පත් හා භාණ්ඩ වන රූපවාහිනී කට්ටල, වීඩියෝ කැසට් රෙකෝඩර, ශීතකරණ, මෝටර් රථ සහ විශේෂයෙන් සැළසුම් කළ ඇඳුම් ආදී සුඛෝපභෝගී දෑය.

පෙරේරාට (2003:64-65) අනුව ජීවිත භාණ්ඩකරණයට ලක් කරමින් භෞතිකවාදී පරිභෝජන සංස්කෘතිය නිර්මාණය කිරීමටත් පවත්වාගෙන යාමටත් දායක වන ගෝලීය පර්භෝජනයේ කේන්ද්‍රස්ථාන වශයෙන් මෝල් සංකීර්ණ (සාප්පු සංකීර්ණ) තීරණාත්මක භූමිකාවක් ඉටු කරයි. සාප්පු සංකීර්ණ තුළ සිදු වන සමාජ අන්තර් සම්බන්ධතා ක්‍රියාවලිය පිළිබඳ ව ෆික්ස් උපුටා දක්වන පෙරේරා (2003) දක්වන්නේ මෙවැනි අදහසකි.

"මෝල් සංකීර්ණයක් යනු හුදෙක් ජනතාව භාණ්ඩ මිළ දී ගැනීම සඳහා පමණක් යන ස්ථානයක් නොවේ. එයටම ආවේණික සමාජ සංස්කෘතික සංවිධානයකි. මෝල් සාප්පු සංකීර්ණ යනු පරිභෝජනය සඳහා වෙන් වූ දේවස්ථාන වේ. ඒවා තුළ පරිභෝජන භාණ්ඩ පූජා භාණ්ඩ බවට පත්වන අතර භාණ්ඩ සඳහා මුදල් හුවමාරු කරගැනීමේ යාතු කර්ම දිව්‍ය සත්ප්‍රාසාදයට සමාන වූ යාතුකර්මයක් බවට පත් වේ" (පෙරේරා, 2003: 64).

ජෝර්ජ් රිට්සර් (George Ritzer, 1993) *The McDonaldization of Society* කෘතියෙන් පෙන්වා දෙන්නේ ඇමරිකානු සමාජය පරිභෝජනයේ මැක්ඩොනල්කරණයට ලක් වී ඇති බවත් එය වේගයෙන් ලෝකය පුරා ව්‍යාප්ත වන බවත් ය. විශේෂයෙන් ම මැක්ඩොනල් සාප්පු සංකීර්ණ පූජනීය ස්ථාන බවට පත්ව ඇති අතර ඇමරිකානුවන්ගේ පරම සුරුවම (Icon) වශයෙන් ක්‍රියා කරන්නේ මෙම සාප්පු සංකීර්ණයි (Ritzer, 1993:05).

මෙවැනි සාප්පු සංකීර්ණ මගින් භාණ්ඩ මිල දී ගත නොහැකි පිරිස් භාණ්ඩ ස්පර්ශයෙන් හා දර්ශනයෙන් වින්දනයක් ලබති. විශේෂයෙන් ම නාගරික මධ්‍යම පාංතික තරුණ පිරිස්වල විලාසිතා රුචිකත්වය හා විලාසිතා රඟ දක්වන වේදිකා බවට මෙම සාප්පු සංකීර්ණ පත්ව ඇත. කොවින්ස්කි (Kowinski, 1985) දක්වන ආකාරයට මෝල් සාප්පු සංකීර්ණයක් යනු රංග භූමි පසුතලයකි. ඔහුට අනුව එම සාප්පු සංකීර්ණ තුළ නිතිපතා වෙළඳ රංගන පවත්වනු ලැබේ. රංගනයේ නළුවන් වන්නේ පාරිභෝගිකයෝ, සේවකයෝ සහ පාලකයෝ ය (Kowinski, 1985). බණ්ඩාරගේට (2001) අනුව ඇමරිකා එක්සත් ජනපදය අන් සෑම තැනකටම වඩා ජීවිතය භාණ්ඩකරණයට ලක් වූ තැනකි. නා නා විධ සාප්පු යාම සඳහා එක්සත් ජනපද වැසියා සතියකට පැය 6ක් පමණ ගත කරයි. 1987 දී සිදු කළ සමීක්ෂණයකින් අනාවරණය වී ඇත්තේ එක්සත් ජනපදයේ නව යොවුන් දැරියන්ගෙන් 93% ගේ ම වඩාත් ම කැමති ම විනෝදාංශය බවට සාප්පු යාම පත් වී ඇති බව ය (බණ්ඩාරගේ, 2001:363).

අධිපරිභෝජනයත් ඉසුරුමත් බව ප්‍රදර්ශනය කිරීමත් නූතන භෞතිකවාදී පරිභෝජන සංස්කෘතියේ මූලික ලක්ෂණයන් ය. මෙම අධිපරිභෝජනයේ තරාතිරම පිළිබිඹු කෙරෙන සංකේත, ඇඳුම් පැළඳුම්, ගතිපැවතුම් ආදියෙන් යුත් අලුත් ජීවන ශෛලියක් පවත්වාගෙන යාමට උත්සාහ ගනී. මෙහි ඇති මූලික ගැටලු දෙකක් හඳුනාගත හැකි ය. ඉන් පළමු වැන්න වන්නේ සංවර්ධිත රටවල් විසින් එන්නත් කරනු ලබන ඉසුරුමත් පරිභෝජන සංස්කෘතිය සංවර්ධනය වෙමින් පවතින රටවල පරිභෝජන සංස්කෘතීන් අතික්‍රමණය කිරීම නිසා ඇති වී තිබෙන සමාජ අසමානතාව යි. දෙවැන්න නම් භෞතිකවාදී ඉසුරුමත් පරිභෝජන සංස්කෘතිය පරිසර හිතකාමී නොවීම ය.

## නිගමනය

ගෝලීය වෙළෙඳපොළ හා පරිභෝජනවාදය තුළ ලොව සෑම වැසියෙක් ම එහි කොටස්කරුවන් බවට පත් කරගෙන ඇතැයි ප්‍රකාශ කිරීම සාධාරණ ය. කේන්ද්‍රයේ අතලොක්සක් වූ රටවල පාරිභෝගික සංස්කෘතිය පර්යන්ත රටවලට ව්‍යාප්ත

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 96-115
ISSN 1800-1459

වීම ගෝලීයකරණයේ නූතන ස්වභාවය යි. එමඟින් පර්යන්ත රටවල පැවති පරිසරහිතකාමී පරිභෝජන රටාවන් අභියෝගයට ලක්කර ඇත. එම රටවල් වේගයෙන් ගෝලීය පරිභෝජන වාදයේ භෞතික කොටස්කරුවන් වෙමින් පවතී. ආසියාතික රටවල වැඩි වශයෙන් මාංශ ආහාර ජනප්‍රිය වීම මීට කදිම නිදසුනකි.

ගෝලීය පරිසර පිරිහීම් දෙස බැලීමේ දී පෙනීයන කරුණක් වන්නේ නූතන පරිභෝජන ක්‍රමය අත්‍යන්තයෙන් ම ඊට හේතුවක් වී ඇති බවයි. කේන්ද්‍රයේ ධනවාදී පරිභෝජන විලාසිතාව කිසිසේත් පරිසර හිතකාමී වන්නක් නොවන අතර එය පාරිසරික සම්පත් ඛාදනයට සහ සූරාකෑමට ලක් කරන්නකි. අනෙක් අතට ගෝලීය පරිභෝජන ආධිපත්‍ය ගෝලීය ජනගහනයෙන් 20%ක් වැනි සුළු පිරිසක් මත පැවතියත් ඔවුහු සමස්ත මානව සංහතියේ ම පැවැත්ම අභියෝගයට ලක්වන අයුරින් සම්පත් පරිභෝජනය කරති. ඒ අනුව මැල්තීසියානු සංවර්ධන න්‍යායවේදීන් දක්වන ආකාරයට ගෝලීය පරිසර පිරිහීම් සඳහා වගකිව යුත්තේ සංවර්ධනය වන රටවල වැඩි වන ජනගහනය නොව ලෝක ගෝලයේ අතලොස්වක් වූ පිරිස විසින් හසුරවනු ලබන පරිභෝජන රටාවයි. අනෙක් අතට සංවර්ධනය වෙමින් පවතින රටවල ජනගහන වර්ධනය පාලනය කිරීම සඳහා අන්තර්ජාතික වශයෙන් සිදු වන මැදිහත්වීමට හෝ බල කිරීමට සාපේක්ෂ ව ගෝලීය පරිභෝජනය මෙහෙය වන්නන් විසින් සිදු කරනු ලබන පරිසර සම්පත් ඛාදනයට එරෙහිව හඬ නැඟීමක් දැකිය නො හැකි ය.

මේ නිසා ගෝලීය පරිසර පිරිහීම හමුවේ මානව සංහතියේ පැවැත්මට එල්ල වී ඇති අභියෝග ජය ගැනීමට නම් ගෝලීය මට්ටමින් සම්පත් භාවිතය හා පරිභෝජනයේ මැද පිළිවෙතකට පැමිණීම නූතනයේ අත්‍යවශ්‍ය වේ. අනෙක් අතට ඒ ඒ රටවලට ආවේණික ව පැවති පරිසර හිතකාමී පරිභෝජන රටාවන් ආරක්ෂාකර ගැනීම සඳහා උනන්දු වීම ද කාලීන අවශ්‍යතාවයකි. උතුරේ රටවල වර්ධනය වන අතිශය පුද්ගලිකත්වය විසින් නිර්මාණය කරනු ලබන තනිකම, කාන්සිය, හුදෙකලාබව පරිසර පැවැත්මට අභියෝගයක් වී ඇත. ඊට හේතුව මෙවැනි පුද්ගලිකත්වයේ අනර්ථයන් විසින් අතිශය පුද්ගලික වූ පරිභෝජනයට පුද්ගලයා තල්ලු කරන නිසා ය. එනිසා හැකිතාක් පොදු පරිභෝජනයට ප්‍රජාව හුරු කරවීමේ ක්‍රමවේදයක් සකසා ගැනීම කාලීන අවශ්‍යතාවකි. මෝටර් රථ, ශීතකරණ, රෙදි සෝදන යන්ත්‍ර, ආදිය හවුලේ පරිභෝජනයට පෙළඹවිය යුතු ය. එමගින් ගෝලීය උෂ්ණත්වය, හරිතාගාර ගැටලු සහ ඕසෝන් ස්ථරය තුනීවීම වැනි බැරෑරුම් පාරිසරික ගැටලු අඩු කරගත හැකි ය.

## පරිශීලිත මූලාශ්‍රය

පෙරේරා, සසංක (2005) "මෝල් සාප්පු සංකීර්ණ: පරිභෝජන වාදයේ දේවස්ථාන ද? අධි යථාර්ථවාදයේ සංකේත ද?" *පයිත සමාජ සංස්කෘතික සමීක්ෂා*, පළමු වෙළුම පිටු: 54-81.

බණ්ඩාරගේ, අසෝකා (2004) *කාන්තාව ජනගහනය හා ගෝලීය අර්බුද*, රත්මලාන, සර්වෝදය විශ්වලේඛා.

සිරිසේන, ඩබ්.එම් (2010) *පාරිසරික සමාජවිද්‍යාව*, වරකාපොල, ආරිය ප්‍රකාශකයෝ.

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013. සත්වැනි කලාපය. පිටු 96-115
ISSN 1800-1459

හෙට්ටිගේ, එස්. ටී (2004) වර්තමාන සමාජ අර්බුදය, කොළඹ, එස් ගොඩගේ සහ සහෝදරයෝ.

Bandarage, A. (1997) *Women, Population and Global Crisis: A Political-Economic Analysis*, Zed Books Ltd, London.

Beck, U. (1992) *Risk Society: Toward a New Modernity*, Cambridge, Polity Press.

Bell, M.M (2004) *An Invitation to Environmental Sociology*, London, Pine ForgePress.

Boserup, Eshter (1965) *The Conditions of Agricultural Growth: The Economics of Agrarian Change Under population Pressure*, Chicago, Aldine.

Catton, W. and R.E.Dunlap (1978) "Environmental Sociology: A New Paradigm". in American Sociologist, 13: 41-9 Catton, W. and R.E.Dunlap 1979. "*Environmental Sociology*" Annual Review of Sociology. 5:243-73.

Durning, A (1992) *How much is Enough? The Consumer Society and the Feature of the Earth*, New York, W.W Norton and Company.

Ehrlich, P.R & Anne H. Ehrlich (1990) *The Population Explosion*, New York, Simon and Schuster.

Kowinski, William (1985) *The Malling of America: An Inside Look at the Great Consumer Paradise*, New York, William Morrow.

Malthus, Thomas.Robert (1976) *An Essay on the Principles of Population*, Philip Appleman (ed), New York, W.W Norton and Company.

Maslow, A (2006) *"A Theory of Human Motivation"*. Psychological Review. 50 (1943): 370-396 advancedhiring.com.2006.

Meadows et al (1992) *The Limites to Growth: A Report for the Club of Rome's Project on the Predicament of Mankind*, New York, Univers Book.

Nyerges, A. Endre (1987) *Lands at Risk in the Third World:Local Level Pespectives*, Boulder, Westview Press.

Ritzer, George (1993) *The McDonaldization of Society*, Sage Publication Company, California.

Rob, W(ed) ( 2004) *Controversies in Environmental Sociology*, Cambridge University Press.

Sahlins, M (1968) *"Notes on the Original Affluent Society"*, Man the Hunter, New York, Aldine Publishing Company.

The State of Human Development, United Nations Human Development Report 1998.

hdr.undp.org/en/media/hdr_1998_en_contents.pdf.

The New Encyclopaedia Britanica, Vol 03, Encyclopadia Britanica, Inc.

Veblen, T (1899) The Theory of the Leisure Class, Chicago, University of Chicago.

World Bank Development Indictors (2008).

www.scribd.com/WorldBankPublications/.../17512075-World-Devel...